ස.සේ.කො.චක්‍රලේඛ අංක 10/2021

මගේ අංකය : ස.සෙ.කො./5/1/iii වෙළුම,
සමුපකාර සේවක කොමිෂන් සභාව (වයඹ),
නව පළාත් සභා ගොඩනැගිල්ල,දෙවන මහල,
කුරුණෑගල.
2021.10.13

වයඹ පළාතේ සියලුම සමුපකාර සමිති,
සංගම් හා මණ්ඩල වල,
ගරු සභාපති / සාමාන්‍යාධිකාරී/ කළමනාකරු,

__විධිමත් පටිපාටියෙන් තොරව සමුපකාර සමිති වලට සේවකයින් බඳවා ගැනීම.__

සමුපකාර සමිති/සංගම් වලට සේවකයින් බඳවා ගැනීමේ දී අනුමත ක්‍රමවේදය නොසලකා සමුපකාර කොමිෂන් සභා චක්‍රලේඛයන්හි විධිවිධාන වලට පටහැනිව පෞද්ගලික කරුණු මුල් කර ගනිමින් සේවකයින් බඳවා ගන්නා බවටත්, වයස අවුරුදු 60 ඉක්ම වූ සේවකයින් තවදුරටත් සේවයේ යොදවා ගැනීම හා/හෝ වයස අවුරුදු 60 ඉක්ම වූ තැනැත්තන් සේවයට බඳවා ගැනීම සිදු කරන බවටත්,එසේ අනීතිකව සේවයේ යොදවා ගනු ලබන තැනැත්තන්ට සමියේ /සංගමයේ මුදලින් වැටුප් හා දීමනා ගෙවීම හේතුවෙන් සමිතියේ මුදල් අවභාවිතා වන බවටත් නිරීක්ෂණය වන බැවින්, ඉහත බඳවා ගැනීමේ කටයුතු වලදී වයඹ පළාත් සමුපකාර සමිති විසින් නොසලකා හරින කරුණු පිළිබඳව සියලුම සමුපකාර සමිති/සංගම් වල අධ්‍යක්ෂ මණ්ඩලයන්හි අවධානය යොමු කිරීමට 2021.09.16 දින රැස් වූ කොමිෂන් සභාවේ දී තීරණය කරන ලදී.

02. එබැවින් ඉදිරියේ දී පුරප්පාඩු තනතුරු සඳහා සේවකයින් බඳවා ගැනීමේදී පහත පරිදි කටයුතු කරන මෙන් මෙයින් දන්වමි.

I. සමිතියෙහි අභ්‍යන්තරයෙන් හෝ බැහිරින් සිදු කරනු ලබන සියලුම බඳවා ගැනීම් අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයක් මත සමුපකාර සේවක කොමිෂන් සභා චක්‍රලේඛයන්හි විධිවිධාන වලට අනුකූලව නියමිත කාර්ය පටිපාටිය අනුගමනය කරමින් සිදු කළ යුතුය.

II. කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු බව සඳහන්ව ඇති සෑම අවස්ථාවකම එකී පූර්ව අනුමතිය ලබා ගැනීමෙන් පසුව පමණක් පත් කිරීම් සිදු කළ යුතුය.

III. කොමිෂන් සභාවේ ආවරණ අනුමතියට යටත්ව කිසිදු පත් කිරීමක් සිදු නොකළ යුතුය.

IV. 2021.09.16 දිනය වන විටත් කොමිෂන් සභාවේ අනුමතියකින් තොරව සේවයේ යොදවා සිටින වයස අවුරුදු 60 ඉක්ම වූ තැනැත්තන් වහාම ක්‍රියාත්මක වන පරිදි සේවයෙන් ඉවත් කළ යුතුය.

V. තවද, වයස අවුරුදු 60 ඉක්ම වූ තැනැත්තන් තවදුරටත් සේවයේ යොදවා ගැනීම නොකළ යුතු බැවින් අවුරුදු 60 සම්පූර්ණ වීමට ආසන්න සේවකයින් සිටී නම් ඔවුන් විශ්‍රාම යන දිනය එළඹෙන තෙක් නොසිට එසේ වයස අවුරුදු 60 සම්පූර්ණ වී විශ්‍රාම යන දිනයට පසුව එළඹෙන ආසන්නම දිනයකදී සේවයට බඳවා ගැනීමට හැකි වන ලෙස සුදුසුකම් ඇති වෙනත් අයෙකු සමුපකාර සේවක කොමිෂන් සභා චක්‍රලේඛයන්හි විධිවිධාන පරිදි තෝරාගෙන කොමිෂන් සභාවේ පූර්ව අනුමතිය ලබා ගැනීමට කටයුතු කිරීමෙන් සමිතියේ /සංගමයේ කාර්යක්ෂම සේවය තහවුරු කර ගත හැකිය.

04. තවද, මෙම චක්‍රලේඛයේ උපදෙස් සම්බන්ධයෙන් ඔබ සමිතියේ /සංගමයේ සියලුම නිලධාරීන් හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු කරන මෙන්ද 2021.09.16 දින රැස් වූ කොමිෂන් සභාවේදී ගනු ලැබූ තීරණය පරිදි වැඩිදුරටත් දන්වමි.

05. මෙම චක්‍රලේඛය 2021.09.16 දින සිට ක්‍රියාත්මක වේ.

06. මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් ගේ එකඟතාවය ඇතිව බව ද දැනුම් දෙමි.

කොමිෂන් සභා නියමය පරිදි,

එච්.එම්.පී.කේ. හේරත්,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව(වයඹ)

පිටපත්- :

1. ප්‍රධාන ලේකම් - වයඹ පලාත. - කා. දැ.පි.
2. ලේකම්, සමුපකාර සංවර්ධන, වෙළඳ,ඉඩම්,විදුලිබල හා බල ශක්ති , ක්‍රීඩා හා යෞවනකටයුතු, සංස්කෘතික, කලා කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය (වයඹ) - කා. දැ.පි.
3. සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් (වයඹ පළාත) - දැ.ගැ.පි - අ.කා.ස.
4. සියලුම සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරු - දැ.ගැ.පි.- අ.කා.ස.
5. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් - කුරුණෑගල,හලාවත,කුලියාපිටිය,මහව. - දැ.ගැ.පි.- අ.කා.ස.